# නිදහස් අධ්‍යාපනයේ මහිමයෙන් බිහිවූ ඇමති දරුවන් දෙදෙනා



වර්තමාන අධ්‍යාපන ඇමති
බන්දුල ගුණවර්ධන



උසස් අධ්‍යාපන ඇමති
එස්. බී. දිසානායක

නිදහස් අධ්‍යාපනයෙන් බිහිවූ විද්වත්හුද, දක්ෂයෝද ශ්‍රීලංකාවේ පමණක් නොව ලෙව සියළු දේශදේශාන්තරවල වෙසෙති. ශ්‍රීලංකාවේ දේශපාලනයට පිවිසි අය අතර මධ්‍ය විද්‍යාලවලින් බිහිවූ අය බෙහෝය. ඉන් කැපී පෙනෙන දෙදෙනෙකු ලෙස වත්මන් රජයේ අධ්‍යාපන ඇමති බන්දුල ගුණවර්ධන මහතා ද, එහිම උසස් අධ්‍යාපන ඇමති එස්. බී. දිසානායක මහතා ද හඳුන්වා දිය හැක. එස්. බී. බිහිවුණේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයෙනි.

බන්දුල ගුණවර්ධන හංවැල්ල මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍යයෙකි. එස්. බී. සහ බන්දුල දෙදෙනාම විශ්වවිද්‍යාල අධ්‍යාපනයද එමගින් ලැබූවෝ වෙති. දෙදෙනම විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපාධිධාරීහුය. එසේම එස්. බී. විශ්ව විද්‍යාලීය සටන් වලට ද සහභාගි වූවෙකි. ඔහු අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලයේ සභාපති වශයෙන් ද කටයුතු කර ඇත.

අද මේ දෙදෙනට සාමාන්‍ය සහ උසස් අධ්‍යාපනය යන දෙඅංශය බාරව තිබෙන බැවින් ශ්‍රීලංකා අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ඇතුළාන්තය හොඳාකාර දන්නා අතර ශිෂ්‍ය අරගල සහ වර්ජණ ගැනද ඔවුන්ට මනා අවබෝධයක් තිබේ.

දැන් මේ දිනවල අප රටේ නොකඩවා අසන්නට ලැබෙන විභාග ප්‍රථිඵල අක්‍රමිකතා, ශිෂ්‍ය ප්‍රශ්න සහ ගැටුම්, ආචාර්යවරුන්ගේ ඉල්ලීම් සහ වැඩවැරීම් දිග්ගැස්සෙමින් පවතින අතර ඒවා විසඳන්නට මේ දෙදෙනාටත් බැරිනම් එය කළ හැක්කේ එසේනම් කාටද? යන්න ඇසිය යුතු ප්‍රශ්නයකි.

පීඨාධිපතිවරු විරෝධතා උද්ඝෝෂණ වල යෙදෙති. අධ්‍යාපන සේවකයෝ වැඩ කරනවාට වඩා වැඩ වර්ජන කරති. සිසුපරපුර ආවේගකාරී දේශපාලන හස්තයන්ට ගොදුරුව සිටිති. නවක සිසුන් පිළිගැනීම නවක වධයක් කර ගෙන ඇත. දැන් දරු- වෙකු මුලින්ම පාසැලට ඇතුල් කිරීම දෙමාපියන්ට ඉමහත් අභියෝගයකි. ඒ සඳහා බොරුකියන්නට, ව්‍යාජ ලිපි ඉදිරිපත් කරන්නට, අල්ලස් දෙන්නට ආදී නොකළ යුතු කපටි වැඩ කරන්නට සමහර දෙමාපියන්ට සිදුව තිබේ. ඒ සියල්ල කුමක් සඳහාද? තම දරුවා පාසැලකට ඇතුළුකර ගන්නට ය.

> ***දැන් දරුවෙකු මුලින්ම පාසැලට ඇතුල් කිරීම ලංකාවේ දෙමාපියන්ට ඉමහත් අභියෝගයකි. ඒ සඳහා බොරු කියන්නට, ව්‍යාජ ලිපි ඉදිරිපත් කරන්නට, අල්ලස් දෙන්නට ආදී නොකළ යුතු කපටි වැඩ කරන්නට ඔවුනට සිදුව තිබේ. ඒ සියල්ල කුමක් සඳහාද? තම දරුවා පාසැලකට ඇතුළුකර ගන්නට ය.***

නිදහස් අධ්‍යාපනයට පිටුපස හරවා මුදල් ගෙවා ජාත්‍යන්තර නමින් යුතු



පාසැල්වලට ඉහළ සමාජයේ දරුවෝ ඇදෙති. විභාග පරීක්ෂණ ආදිය අවුලකි. සරසවි පිවිසුමට ලකුණු ප්‍රමාණය තීරණය කිරීමට සිදුව ඇත්තේ අධිකරණයටය. තමාට විශ්ව විද්‍යාලයට යාමට අවස්ථාව ලැබීදැයි විමසීමට සිසුවෝ උසාවි යති. ගුරු මාරු, ගුරුපත්වීම්, විදුහල්පති පරිපාලනය පිළිබඳ විනිවිදභාවයක් නැත. පාසැල් පන්තිකාමරය තුළද අධ්‍යාපනයට වඩා සංදර්ශණ වැඩ පිරී ඇත.

කන්නන්ගර අධ්‍යාපන සංකල්පය වසා වෙනත් සංකල්ප බිහිවනු පෙනේ. මහා බ්‍රිතාන්‍යය, ඇමරිකාව පමණක් නොව, ඉන්දියාවේද කුමන දේශපාලන පක්ෂයක් බිහිවුවද වෙනස් නොකරන ජාතික ප්‍රතිපත්ති තුනක් තිබේ. ඒවා නම් විදේශ, ආරක්ෂක සහ අධ්‍යාපන ප්‍රතිපත්තීන්ය. ශ්‍රීලංකාවේ නම් රජයක් නොව ඇමතිවරයෙකු මාරුවන විට පවා අධ්‍යාපන ප්‍රතිපත්ති වෙනස්කරනු දැකිය හැක.

ශ්‍රීලංකා මධ්‍යවිද්‍යාලවල ඉගෙන විවිධ ක්ෂෙත්‍රයන්හි කැපීපෙනෙන්නාවූ සේ- වයක යෙදුණු ආදි ශිෂ්‍යයන් විසින් සමස්ථ ලංකා මධ්‍යවිද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමයක් පිහිටුවනු ලැබ ඇත. මෙමගින් පාසැල් මට්ටමින් කන්නන්ගර නිදහස් අධ්‍යාපන සංකල්පය නැවතත් සිහිපත්කර දීමට වැඩ පිළිවෙලක් අරඹා තිබේ. වර්තමාන සිසු පරපුර නිදහස් අධ්‍යාපන රටාවකට යොමුකිරීමටත්, අධ්‍යාපන බල ධාරීන්ගේ හෘද ස්පන්දනය ඇතිකර ඔවුන් අවදි කරවා, නිදහස් අධ්‍යාපන සද්කාර්යයට යොමුකරවීමටත් පියවර ගෙන ඇත.

1884 ඔක්තෝබර් 13 වන දින ඉපිද, 1969 සැප්තැම්බර් 13 වන දින අභාවප්‍රාප්ත වූ ආචාර්ය ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර නමැති එම ශ්‍රේෂ්ඨ විද්වතා බිහිකළ නිදහස් අධ්‍යාපන සංකල්පයෙන් බැහැර නොවී කටයුතුකිරීම ලාංකික අප කාගේත් ඒකායන පරමාර්ථය වියයුතු බව මම විශ්වාස කරමි.



**Major V. B. Karunaratne**
**Ex Deputy Sergeant-At-Arms in Sri Lanka Parliament**
**Oxford UK**

# අ.ත.ක.ස. ලන්ඩන් ශාඛාව ආරම්භ කරති!




*නියෝජ්‍ය මහකොමසාරිස් ලෙනගල මහතා ආරම්භක කාව්‍ය සභාව අමතයි. කෝන්වැවේ ආරියරතන හිමියන්ද අනුර හැගොඩ මහතාද දකුණු පස සිටිති.*

අගනුවර තරුණ කවි සමාජයේ ලන්ඩන් ශාඛාව සම්භාවනීය අමුත්තන් ගෙන් සහ ලන්ඩනයේ වෙසෙන කවීන්ගේ සහභාගිත්වයෙන් පසුගිය 23 වන දා පිහිටුවාගන්නා ලදී. උත්සවය පැවතියේ බටහිර ලන්ඩනයේ හවුන්- ස්ලෝ පෙදෙසේ ඉන්දීය මධ්‍යස්ථානය නමින් හැඳින්වෙන උත්සව ශාලාවේදීය.

1935 අප්‍රියෙල් මස 12 වන දින කොළඹ වික්ටෝරියා පාක් හි(දැන් විහාරමහාදේවි උද්‍යානය) රැස්වූ සිංහල කවීන් තිදෙනෙකුගෙන් බිහිවූ **අ ත ක ස** මව් සංගමය එදා මෙදා තුර එනම් වසර 77 ක් තිස්සේ සඳැස් කවියට සිදුකළ සහ සිදුකරමින් තිබෙන මෙහෙය අප්‍රමාණය. කොළඹ යුගයේ කවිය නමින් අද දවසේ හඳුන්වන වර්තමාන කවියුගය බැබලවූයේ **අ ත ක ස** මගින් වන අතර එය තවමත් සක්‍රීයව ශ්‍රීලංකාව පුරා සිංහල කවියේ අභිවෘධිය තකා වෙහෙසෙමින් සිටින්නීය.

නීතිඥ අනුර හැගොඩයන්ගේ අදහසක් අනුව බිහිවූ අතකස ලන්ඩන් ශාඛාවේ මංගල රැස්වීම ලන්ඩනයේ ශ්‍රීලංකා නියෝජ්‍ය මහකොමසාරිස් ආර්. එම්. කේ. ලෙනගල මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර එයට රසික රසිකාවි යන් ඉතා විශාල පිරිසක් සහභාගිවී සිටීම සිංහළ කවියට ලන්ඩනයේ සිංහළ ජනකොට්ඨාශය තුළ ඇති ලැදියාව ප්‍රකටකරවන්නක් වීය. එහිදී ලෙනගල මහතාට අමතරව ශ්‍රීලංකාවේ සුප්‍රකට රංගන ශිල්පී දයා අල්විස්, ලංකාවිත්ති පුවත්පතේ කර්තෘ දයා ආනන්ද රණසිංහ, ලංකා සංචාරක මණ්ඩලයේ නලීන් පෙරේරා, ශාඛා සභාපති නීතිඥ අනුර හැගොඩ සහ ප්‍රධාන ලේකම් පූජ්‍ය කෝන්වැවේ ආරියරතන හිමියන් විසින් දේශන පවත්වන ලදී.

චන්දන ෆොන්සේකා, සුනීතා පෙරේරා, ටිලී අයිරින් සහ ප්‍රියංගි පලන්සූරිය මනහර කවි ගායන- යෙන් රැසිව සිටි රසික පිරිස පිනවූ අතර, මෙහෙයවීම ශාඛා සංවිධායක ආසිරි බණ්ඩාරයන් අතින් සිදුවිණ.

